# දිවියෙහි කොහෙදෝ

සාංකච්ඡාවට එක්වූ අනෙක් තරුණයා ටී. ජී. දයාරත්නය. ඔහු සුලු ව්‍යාපාරිකයෙකි. තම ව්‍යාපාර වලට අමතරව කුකුලන් ඇතිකරන දයාරත්න බ්‍රොයිලර් වර්ගයේ කුකුලන් ඇතිකිරීමට කැමැත්තක් දක්වයි. ''බ්‍රොයිලර් ඇති කිරීමේදී බිත්තර දමන වර්ග වගේ නොවෙයි. හොඳට වෙළෙඳ පල ගැන අව බෝධයක් තියෙන්න ඕනේ. අප්‍රියෙල්, දෙසැම්බර් වගේ උත්සව කාල වලදී කුකුල් මස් මිල ඉතා

ඉහළ යනවා ඒ වාසිය ලබාගන්න නම් හරියටම ඊට දින 75 කට 80 කට පෙර පැටවු ගේන්න ඕනෑ. බ්‍රොයිලර් වර්ගයේ සතුන්ට දිවා රාත්‍රි හොඳට කෑම දීල හැකිතරම් ඉක්මනින් නියම බර ලබාගන්න අවශ්‍යයි. අනිත් අතට බ්‍රොයිලර් සතුන්ට හතරැස් අඩි 1 කට වඩා ඉඩකඩ තිබුනොත් ඒක බර අඩු වීමකට බල පානව''.

කුකුල් කෑම ප්‍රශ්නය ගැන තොරතුරු දක්වීමට ඉදිරිපත් වුනේ බාලසූරියයි. ''කුකුලන් ඇතිකරන් නෙක්, නියමිත පරිදි කෑම ලබා ගන්න පදනමක් දමා නොගත හොත් විශාල අවදානමකට ලක් වෙන්න වෙනවා. සමහර විට, වගාවකට පෝර දැම්ම දින කීප යක් පමා වුනොත් වන හානිය වගේ නොවෙයි, කුකුලන්ට දවසක් කෑම නැතිවුනොත්. උන් මැරෙන් නත් ඉඩ තියෙනවා. අනික් අතට බිත්තරත් අඩුවෙනවා. මේ නිසා අපි හැමවිටදීම දින 10 - 12 කට අවශ්‍ය කෑම ගබඩා කර තබා ගන්නවා. තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය තමයි, අද හොඳම තත්වයේ සත්වාහාර නිෂ්පාදකයා ඔවුන් වර්ග තුනක් එනම් පැටවුච් කෑම, වැඩෙන සතුන්ට සහ බිත්තර දමන කිකිලියන්ට මිශ්‍රණයක් නිපද වනවා. කොහොම උනත් සමහර කාල වලදී වෙළඳ පලේ කුකුල් කෑම හිඟය ඉතාම උග්‍ර වෙනවා එවිට අපට වැඩි මිළකට බාල කෑම වර්ග ගැනීමට වෙනවා. තවත් අතකින්, සීදුවේ නිෂ්පාදන ආරක්ෂිතව අසුරා නැති නිසා සමහර ව්‍යාජ නිෂ්පාදකයන් හිස් කෑම උරවලට දහයියා ආදී වල් පල් පුරවලා අලෙවි කරනවා. ඒවගේ කෑම දීමෙන් සිදුවන්නේ කුකුල් පටවි විනාශ වීමයි.:'

කුකුලන් ඇති කිරීමෙන් ලබාගත හැකි ආදයම පිළිබඳ තොරතුරු හෙළි කල දයාරත්න, ''සාමාන්‍ය-යෙන් බිත්තර දමන කිකිලියක ගෙන් රුපියල් පහක ශුද්ධ ලාභයක් මාසිකව උපයන්න පුළුවනි. දළ වශයෙන් වර්ෂ එක හමාරක් බිත්තර හොඳින් ලබා ගත හැකි අතර මීට අමතරව, කුකුල් පොහොර කරත් තයක් රුපියල් තිහකට පමණ අලෙවි කළ හැකියි. අනෙක් අතට බිත්තර දමන කාලය අවසානයේදී මසට අලෙවි කිරීමෙන් ඊළඟ පැටවු තොගය සඳහා මුදල් ලබා ගත හැකියි.''

ඔබට ඇති ගැටලු මොනවාද? මම ප්‍රශ්නයක් නැඟුවෙමි. විශේෂ යෙන්ම කුකුල් කෑම මිළ පසුගිය කාලේ 50% කින් පමණ ඉහළ ගියා. රුපියල් 62/50 කෑම උරයක් රුපියල් 95/- ක් පමණ වුනා. මේ තත්වය සුලු පරිමාණ කුකුල් පටවි හිමියන්ට බරපතල පහරක්. අපට බිත්තරයකට එද ලැබුණු මිල රුපියලක් වුනත් අද 1-10 ට වඩා ලැබෙන්නේ නැහැ. මේ තත්වය නිසා බොහෝ දෙනෙක් කුකුලන් ඇති කිරීම නැවැත්තුවා. වෙළෙඳ පොලේ මිල සකස් වෙන තුරු පාඩු දරාගෙන ඉන්න පුළුවන් ලොකු ව්‍යාපාරිකයින්ට විතරයි. මේ නිසා තමන්ටම කෑම නිපදවා ගතහැකි මහා පරිමාණ ව්‍යාපාරිකයෝ කීපදෙනෙක් අද බිත්තර වෙළෙඳ පල අල්ලාගෙන ඉන්නවා. අනික් අතට චීන කුකුල් මස් ගෙන ඒම නිසා, අපේ කුකුල් මස් වලට ලැබුණු මිල හුඟක්ම පහල වැටුනා දැනට නම් ඒ තත්වය වෙනස් වී තියෙනවා. දයාරත්න කතා කලේ චෝදනා මුඛයෙනි.

කුකුලන් ඇති කරන්නන්ට ඇති අනිකුත් බරපතල ගැටලුව වෛද්‍ය උපදෙස් නිසි කලට නොලැබීමයි. අපේ ගමේ සිට පශු වෛද්‍ය කාර්යාලයට සැතැප්ම 8 ත් දුරයි. ලෙඩක් හැදුනොත් සතුන්ව අරන් එතෙන්ට යන්න ඕනෑ. ඒත් බොහෝ වෙලාවට නිසි ප්‍රතිකාර ලබා ගන්න. ලැබෙන්නේ නැහැ. අනික් අතට ක්ෂේත්‍ර නිලධාරින් ගොවිපලවලට එන්නේ ඉතාමත් කලාතුරකින්. සමහරවිට එන්නේම නැහැ'' ඔහු තව දුරටත් ප්‍රකාශ කළා.

''මුදල් සපයා ගැනීම පිළිබඳව ගැටලුවක් අපේ ගම සම්බන්ධව නම් නැහැ. අද වාණිජ බැංකුවල පොලිය ඉතාම අධිකයි. මේ නිසා අපේ ගමේ ගොවින් හා සුලු

# බාධා නැත්තේ ?...

ව්‍යාපාරිකයන් වගේ අය එකු වෙලා සමුපකාර ණය දෙන සමිතියක් ආරම්භ කරලා දියුණු තත්වයට ගෙනත් තියෙනවා. පැය විසිහතරක් ඇතුළත රුපියල් **2000/-** ක් **12%** වර්ෂික පොලියකට එයින් ලබා ගත හැකියි''

බාලසූරියට මුදල් ප්‍රශ්නය එත රම බරපතල නැති හැඩයි. ස්ව ශක්තිය මත විශ්වාසය තබා සංවිධානය වුනු මෙවැනි තරුණයින්, රජය විසින් පශු සම්පත් සංවර්ධන යට බඳවාගත යුතුය.

තරුණයින්ට විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයි. අනිත් අතට, කුකුල් කෑම නිෂ්පාදනය කරත සුළු පරිමාණ කර්මාන්ත ශාලා, ඇති කිරිමෙන් සහ මිළ අඩු කිරීමෙන් රජය සහයෝගය දිය යුතුය, නැති නම් අඩුම වශයෙන් දැනට පවතින සත්වාහාර මිලවත් සැලකියයුතු කාලයක් යනතුරු නියතව තබා ගත යුතුයි. එහෙම නොවුනොත් සිදු වන්නේ ගම්බද පොඩි මිනිහා සත්ව පාලනයෙන් ඈත් වීමයි. ඒක විශාල පාඩුවක්,''

මිශ්‍ර කළ සත්ව ආහාර නොදී අහුලා ගෙන කන ගම්බද කුකුලන් වර්ග ඇති කිරීම ගැන දයාරත්න තව දුරටත් කරුණු විස්තර කළා. 'සාමාන්‍යයෙන් ගෙදර කෑමට බිත්තර ලබාගන්න කිකිලියන් කීප දෙනෙක් ඇති කිරීම ගම්බද ගෙවල් වල ලක්ෂණයක්. ඒ අතරම, පාන්දරට හඬලන කුකුලාගේ උදාර හඬ ජයග්‍රහනයේ හා සෞභාග්‍යයේ සංකේතයක්. ඒත්, විශාල සතුන් තොගයක් ඇති කර ආර්ථික ලාභ ලබා ගැනීමට නම් තෝරා ගතයුතු දියුණු කළ සතුනුයි. වයිට්ලැග්හෝන් ආර් අයි ආර් වගේ වර්ග වලින් කුකුලන් ඇති කරන්නට පටන් ගත් අපි දැනට ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථාන වලින්ද පෞද්ගලික අංශයන්ද නිපදවන ලද සතුන් වර්ෂ දහයකට වඩා ඇති කරල තියෙනවා. සමහර ප්‍රදේශවල දුඹුරු බිත්තර වලට පාරිභෝගිකයින් වඩා කැමතියි. සමහර අය ගම් බිත්තර වලට වැඩි ඉල්ලුමක් දක්වනවා. ඒත්, මේවා අතර ගුණයෙන් වෙනසක් නෑ. නමුත් සාමාන්‍යයෙන් සුදුපාට බිත්තර දමන සතුන්ගේ නිෂ්පාදනය වාසියි. ඒ වගේම ලෙඩ රෝග වලට ඔරොත්තු දෙන ශක්තිත් අඩුයි.''

**බිත්තර වල පෝෂණීය ගුණය හා පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය පෝෂණ ප්‍රමාණය**

| | බිත්තර දෙකක ඇති ප්‍රමාණය | පුද්ගලයෙකුට අවශ්‍ය ප්‍රමාණය | බි: දෙකකින් ලැබෙන ප්‍රමාණයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| කැලරි | 160 — 180 | 2500—3000 | 5.3% |
| ප්‍රෝටීන් | ග්‍රෑම 12 | ග්‍රෑම 82 | 18,6% |
| කැල්සියම් | ග්‍රෑම 12 | ග්‍රෑම 800 | 7% |
| යකඩ | මිලි ග්‍රෑම 2.54 | මිලි ග්‍රෑම 12 | 21.1% |
| විටමින් ඒ හා කැරටින් | ඒකක 1000 | ඒකක 5000 | 20% |
| තයමයින් බී 1 | මිලිග්‍රෑම 0.10 | මිලිග්‍රෑම 1.2 | 8.3% |
| රයිබෝෆ්ලේවින් බී 2 | මිලිග්‍රෑම 0.35 | මිලිග්‍රෑම 1.8 | 19.4% |

මූලය; යුරෝපීය පොදු වෙළඳ පලේ බිත්තර සඳහා අලෙවි තත්ත්වය (බිත්තර පිළිබඳව තවත් විස්තර, මහා බ්‍රිතාන්‍යයේ සීමාසහිත ගෝල්ඩන් එග්ස් සමාගම මගින් නිකුත් කරන ලද්දකි.